සැ. යු. — 2015.03.20 දින පළ වූ අංක 1,907 දරන ගැසට් පත්‍රයේ III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,908 - 2015 මාර්තු මස 27 වැනි සිකුරාදා - 2015.03.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 628 | පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | 640 | අයවැය ලේඛන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 641 | දේපළ විකිණීම් ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | 647 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 අප්‍රේල් මස 17 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 අප්‍රේල් මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## යටිනුවර ප්‍රාදේශීය සභාව

අංක 1864 දරන 2014 මැයි මස 23 වැනි සිකුරාදා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) වැනි පළාත් පාලන කොටසේ පළ වූ *ගැසට් නිවේදනය* මෙයින් අවලංගු කරන අතර, පහත සඳහන් *ගැසට් නිවේදනය* බලාත්මක කරන බව මෙයින් දන්වමි.

යටිනුවර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවතින පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් නියමිත සුදුසුකම් ඇති යටිනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|
| රියදුරු III | 02 | PL3- 2006A<br>රු.12,470 - 10 x 130 - 10 x 145- 10 x 160 - 12 x 170 - රු. 18,860 | අධ්‍යයන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගයක දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම. මින් විෂයයන් 05ක් එකවර සමත් වී තිබිය යුතු ය.<br><br>*වෘත්තීය සුදුසුකම් :*<br><br>මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ එක් එක් තනතුර සඳහා අදාළ වන ඛාණ්ඩයේ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම.<br><br>පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොණ්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද නිපුණතාවය පිළිබඳව සහතිකයක් ලබා තිබීම. (බඳවා ගන්නා දිනට වසර 03කට පෙර අවම වශයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද සී හා සී1 වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී පන්තියේ බලපත්‍රයක් තිබීම.)<br><br>තාර බර හොණ්ඩර 34ට වැඩි බර මෝටර් වාහන බර ටේලර් සහ මගීන් 32ට නොවැඩි සංඛ්‍යාවක් ගෙනයා හැකි බස්රථ සඳහා රියදුරු බලපත්‍රයක් තිබීම. (බඳවා ගන්නා දිනට වසර 03කට පෙර අවම නිකුත් කරන ලද ඒ වාහන පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව බී පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම.) |
| සෞඛ්‍ය කම්කරු | 02 | PL1- 2006A<br>රු.11,730 - 10 x 120 - 10 x 130 -10 x 145 - 12 x 160 - රු. 17,600 | 08 වැනි ශ්‍රේණියට (නමවන වසරට) නියමිත විෂයය සම්පූර්ණ කර තිබිය යුතු ය. |

02. *වෙනත් සුදුසුකම් :-*

(i) අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය;
(ii) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍යය තත්ත්වයකින් යුක්ත විය යුතු ය;
(iii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය;
(iv) අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය;
(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු කරනු ලැබූවකු හෝ පළාත් පාලන සේවයෙන් පහකරනු ලැබූවකු නොවිය යුතු ය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය;
(ii) පත්වීම වසර තුනක පරිවාස කාලයකට යටත් වේ;
(iii) මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා දෙපාර්තමේන්තු නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතු ය.

04. සුදුසුකම් සපුරාලන අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවීමෙන් පසුව සම්මුඛ පරීක්ෂණයක් සඳහා භාජනය කරනු ඇත.

05. අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලියකියවිලිවල පිටපත් ද එවිය යුතු ය :-

(i) උප්පැන්න සහතිකය;
(ii) අධ්‍යාපන සහතික;
(iii) පදිංචිය සනාථ කිරීමේ සහතික;
(iv) මෑතක දී ලබාගත් චරිත සහතික 02 ක්;
(v) මෑතක දී ලබාගත් ග්‍රාමසේවා සහතිකය;
(vi) වෘත්තීය සුදුසුකම් දැක්වෙන සහතික;
(vii) පළපුරුද්ද දැක්වෙන සහතික.

තනතුර ඉල්ලීම අපේක්ෂා කරන අයදුම්කරුවන් මෙහි දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පතක් 2015 අප්‍රේල් මස 17 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන්, "ලේකම්, යටිනුවර ප්‍රාදේශීය සභාව, ඇඹිල්මීගම, පිළිමතලාව" යන ලිපිනයට එවිය යුතු ය. අදාල අයදුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ තනතුර සඳහන් කළ යුතු ය.

ඩබ්. පී. සෙනෙවිරත්න බණ්ඩාර,
ලේකම්, *(වැ. බ.)*,
යටිනුවර ප්‍රාදේශීය සභාව.

2015 පෙබරවාරි මස 10 වැනි දින,
යටිනුවර ප්‍රාදේශීය සභාවේ දී ය.

යටිනුවර ප්‍රාදේශීය සභාව

**................................................................................................................ තනතුර සඳහා අයදුම්පත්‍රය**

1. මුලකුරු සමග නම :——————————.
2. මුලකුරු වලින් හැඳින්වෙන නම් :——————————.
3. ස්ථිර ලිපිනය:——————————.
4. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————.
5. උපන් දිනය: අවුරුද්ද :——————————. මාසය:——————————. දිනය:——————————.
6. ශ්‍රී ලංකා පුරවැසියකු වන්නේ උපතින් ද ? ලියාපදිංචි වීමෙන් ද:——————————.
7. අධ්‍යාපන සුදුසුකම්:——————————.
(i) අ.පො.ස. (සා.පෙළ) විභාගය:——————————.
සමත් වර්ෂය හා විභාග අංකය:——————————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

(ii) වෙනත් සුදුසුකම් :——————————.
8. වෘත්තීය සුදුසුකම් :——————————.

9. සේවා පළපුරුද්ද :-
(i) දැනට සේවය කරන ආයතනය:——————————.
(ii) දැනට දරන තනතුර:——————————.
(iii) එම තනතුරට පත් වූ දිනය:——————————.
(iv) පෙර සේවය කරන ස්ථානයේ දරන ලද තනතුර:——————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු දක්වා ඇති බවට ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බව ද මම දනිමි.

——————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————————.

*ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ................................................. මයා මෙම ආයතනයේ .......................................................... වශයෙන් සේවය කරයි. ඔහු සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු මොනම ආකාරයේ හෝ නීත්‍යානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

________________________,
ආයතන ප්‍රධානියා.

ආයතනය :———————————————.
නම :———————————————.
පදවිය :———————————————.
දිනය :———————————————.

03-804

---

**මතුගම ප්‍රාදේශීය සභාව**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම

මතුගම ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | *තනතුරු නාමය* | *පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* | *වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01. | වැඩ /ක්ෂේත්‍ර කම්කරු | 02 | PL1-(2006A) රු.11,730 - 120 x 10 - 130 x 10 - 145 x 10 - 160 x 12 = රු.17,600 (රු.12,090 ට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.) | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය 9 වසර සමත් විය යුතුය. | |
| 02. | සෞඛ්‍ය කම්කරු | 01 | PL1-(2006A) රු.11,730 - 120 x 10 - 130 x 10 - 145 x 10 - 160 x 12 = රු.17,600 (රු.12,090 ට එළැඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.) | අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ. | |

02. මතුගම ප්‍රාදේශීය සභාවේ දැනටමත් අනියම්, ආදේශක හෝ ව්‍යාපෘති පදනම මත සේවය කරනු ලබන අයගේ අයදුම්පත් කෙරෙහි වැඩි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

*03. වයස :*

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය.
(දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයට මෙම උපරිම වයස් සීමාව බලනොපැවැත් වේ.)

*04. වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචියෙන් ලාංකික පුරවැසියෙකු විය යුතු ය;
(ii) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය;
(iii) අයදුම්කරු ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට බස්නාහිර පළාත තුළ වසර 3 කට නොඅඩු කාලයක් තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය. (ඡන්ද හිමි නාම ලේඛනයෙන් හෝ ග්‍රාම නිලධාරි/ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතු ය);
(iv) රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ආයතන විසින් සේවයෙන් පහකරනු ලැබූ අයෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 44/90 යටතේ විශ්‍රාම ලැබුවෙකු නොවිය යුතු ය;

(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ අධිකරණය මගින් දඬුවම් පමුණුවනු ලැබූ අයෙකු නොවිය යුතු ය;

(vi) අවශ්‍ය වෙතොත් සභාව විසින් නියම කරනු ලබන ඇපයක් මුදලින් හෝ රක්ෂණ සහතිකයක් මගින් තැබීමට සූදානම් විය යුතු ය;

*05. පොදු කොන්දේසි :*

(i) මනා පෞරුෂයකින් යුක්ත විය යුතුය;
(ii) මෙම පත්වීම ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය;
(iii) තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ය;
(iv) පරිවාස කාලය අවසානයේ ස්ථිර කිරීම සලකා බලනු ලැබේ.;
(v) බඳවා ගැනීමෙන් පසුව ඔබ විසින් ඉදිරිපත් කර ඇති අධ්‍යාපන සුදුසුකම් හෝ වෙනත් සුදුසුකම් ව්‍යාජ හෝ අසත්‍ය බවට තහවුරු වුවහොත් වෙනත් කිසිම දැනුම් දීමකින් තොරව පත්වීම අවසන් කරනු ලැබේ.

*06. අයදුම්පත් :*

අයදුම්කරුවන් මෙම උපලේඛනයේ දැක්වෙන ආකෘතියට අනුව පිළියෙල කරගත් අයදුම්පත් 2015.04.10 වැනි දිනට පෙර "ලේකම් ප්‍රාදේශීය සභාව - මතුගම" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "අයදුම් කරන තනතුර" සඳහන් කළ යුතු ය.ප්‍රමාද වී ලැබෙන හා තැපෑලේ දී නැතිවන අයදුම්පත් පිළිබඳව වගකියනු නොලැබේ.

07. සුදුසුකම් ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

08. අයදුම්පත් සමග පහත සඳහන් සහතික පත්වල පිටපත් අමුණා එවිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණයේ දී මුල් සහතික ඉදිරිපත් කළ යුතු ය.

*(අ)* උප්පැන්න සහතිකය;
*(ආ)* අධ්‍යාපන සහතික ;
*(ඇ)* පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම් සහතිකය/ඡන්ද නාම ලේඛනයේ පිටපත;
*(ඈ)* මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් (එකක් පදිංචි වසමේ ග්‍රාමසේවා නිළධාරියාගෙන්);
*(ඉ)* වෘත්තීය පළපුරුද්ද හා වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික.
*(ඊ)* දැනටමත් සේවයේ යෙදෙන බවට දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය.

09. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ ඒ අතරතුර හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී සියලු බලතල මතුගම ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.

10. බඳවා ගන්නා දිනට තිබෙන සියලුම පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලබන බැවින් ඉහත සඳහන් තනතුරුවල සංඛ්‍යාවන් වෙනස් වීමට ද ඉඩ තිබේ.

අසෝක රණසිංහ,
ලේකම්,
මතුගම ප්‍රාදේශීය සභාව.

2015 පෙබරවාරි මස 26 වැනි දින,
මතුගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***මතුගම ප්‍රාදේශීය සභාව***

*............................................ තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. අයදුම්කරුගේ නම (මුලකුරු සමග) :——————.
මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————.
02. තැපැල් ලිපිනය :——————.
03. උපන් දිනය:
අවුරුද්ද :——————, මාසය:——————, දිනය:——————.
04. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස:
අවුරුදු:——————, මාස:——————, දින :——————.
05. විවාහක/අවිවාහක බව:——————.
06. ජාතිය:——————.
07. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද? යන වග:——————.
08. අධ්‍යාපන සුදුසුකම්:——————.

09. වෘත්තීය සුදුසුකම්:————————.
10. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම්,

(i) දැනට දරන තනතුර:————————.
(ii) එම තනතුරට පත් වූ දිනය:————————.
(iii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත්/ පදනම මත ද):————————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බවත් දනිමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————.

03-792

---

## බුලත්සිංහල ප්‍රාදේශීය සභාව

බස්නාහිර පළාතේ බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට සුදුස්සන් තෝරා පත් කරගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ වසර 03 ක ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි අයදුම්කරුවන්ට හා මෙම සභාවේ දැනට අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුතු අය කෙරෙහි විශේෂයෙන් සලකා බලනු ලැබේ.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *තනතුරු ගණන* | *වාර්ෂික වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 1 | වැඩ/ ක්ෂේත්‍ර පරිපාලක III ශ්‍රේණිය | 1 | රු.13,120 - 10 x 145 - 11 x 170 - 10 x 240 - 10 x 320 - රු. 22,040 | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් 2ට සම්මාන සාමාර්ථ සහිතව එක වර විෂයයන් 6 අ.පො.ස. (සා..පෙළ) විභාගය සමත්වී තිබීම;<br>*සහ*<br>අ.පොස. (උ.පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයන් එකක්වත් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම. |
| 2 | කාර්යාල කාර්ය සහායක II | 2 | රු.13,060- 10 x 120- 10 x 130- 10 x 145- 12 x 160- රු.17,600 | අ.පො.ස. (සා./පෙළ) විභාගයේ දී එක් වරක දී කවර හෝ විෂයයන් 06 සමත්වීම |
| 3 | වැඩ/ක්ෂේත්‍ර කම්කරු III | 04 | රු.11,730- 10 x 120- 10 x 130- 10 x 145- 12 x 160- රු.17,600 | අවම වශයෙන් 8 වන ශ්‍රේණිය /09 වසර සමත්වීම |
| 8 | සෞඛ්‍ය කම්කරු III | 01 | රු.11,730- 10 x 120 - 10 x 130 - 10 x 145- 12 x 160- රු.17,600 | අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ. |

02. *අවශ්‍ය වෙනත් සුදුසුකම් :-*

(i) අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන 2015.04.06 වන දිනට පරිපාලක තනතුරු සඳහා වයස අවුරුදු 18 ට නොඅඩු හා අවු : 30 ට නොවැඩි විය යුතුය.
(ii) අනෙක් තනතුර සඳහා වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. (දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)
(iii) අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
(iv) අයදුම්කරු බස්නාහිර පළාත තුළ අවුරුදු 03 කට නොඅඩු කාලයක සිට ස්ථිර පදිංචි අයෙක් විය යුතුය.
(ඡන්ද හිමි නාම ලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් සනාථ කෙරෙන ග්‍රාම නිලධාරි සහතිකයකින් සනාථ විය යුතුය.)
(v) අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.
(vi) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.
(vii) රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර නිළධාරීන්ට තනතුරු සඳහා ඉල්ලුම්පත් භාරගැනීමේ අවසන් දිනට පූර්වාසන්න වන අවු 05 ක කාලය තුළ වරදකට (අවවාද කිරීමකට හැර) දඬුවමක් ලබා නැත්තාවූ ද, මෙම කාලය තුළ හිමි සියළු වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූද, සතුටුදායක සේවා කාලයක් සපුරන අයෙකු විය යුතුය.

03. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :-*

(i) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. අවු 03 ක පරිවාස කාලයකට යටත්වේ.
(ii) වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතු වේ.
(iii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවටද, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසිවල ටද රජයේ හෝ පළාත් සභාව හා පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් වරින්වර නිකුත් කරනු ලබන නියෝගවලට ද අනුකූලව ක්‍රියාකිරීමට පත්වීම්ලාභීන් බැඳී සිටිය යුතුය.

04. *බඳවා ගැනීමේ ක්‍රමය :-*

(i) වැඩ/ක්ෂේත්‍ර පරිපාලක තනතුර සඳහා ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව ප්‍රමුඛතා ලත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට ලක්කර සුදුසුකම් පරීක්ෂා කෙරේ.
වැඩ/ක්ෂේත්‍ර පරිපාලක තනතුරු සඳහා ලිඛිත පරීක්ෂණය අභියෝගතාවය හා බුද්ධි පරීක්ෂණය හා කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය පරීක්ෂා කෙරෙන ප්‍රශ්න පත්‍ර 02කින් සමන්විත වේ.
(ii) අනෙකුත් තනතුරු සඳහා බඳවා ගැනීමේ පටිපාටීන්ට අනුව ලිඛිත/සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත සුදුස්සන් තෝරා ගැනේ.
(iii) අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල ඡායාපිටපත් අමුණා එවිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය ;
*(අ)* උප්පැන්න සහතිකය;
*(ආ)* අධ්‍යාපන සහතික;
*(ඇ)* තම පදිංචිය සහතික කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය;
*(ඈ)* මෑතකදී ලබා ගත් චරිත සහතික දෙකක් (02);
*(ඉ)* වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ සහතික;
(iv) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්ෂණයට/සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

05. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2015.04.06 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලේකම්, ප්‍රාදේශීය සභාව, බුලත්සිංහල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීමේ සම්පූර්ණ බලතල බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ටී. එම්. සියඹලාගොඩ,
ලේකම්,
බුලත්සිංහල ප්‍රාදේශීය සභාව.

2015 මාර්තු මස 11 වැනි දින,
බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**බුලත්සිංහල ප්‍රාදේශීය සභාව**

**..............................................තනතුර සඳහා අයදුම්පත්‍රය**

01. අයදුම්කරුගේ නම මුලකුරු සහිතව :————————————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————————————.
03. තැපැල් ලිපිනය:————————————.

04. දුරකථන අංකය:———————————.
05. උපන් දිනය:———————————.
2015.04.06 වන දිනට වයස ඃ අවු :———————————. මාස:———————————. දින:———————————.
05. ස්ත්‍රී/පුරුෂ භාවය :———————————.
06. විවාහක/අවිවාහක බව:———————————.
07. ජාතිය:———————————.
08. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද?:———————————.
පරම්පරාවෙන් ද/ලියාපදිංචියෙන්ද යන වග:———————————.
09. අධ්‍යාපන සුදුසුකම් (සහතික වල ඡායා පිටපත් අමුණන්න.):———————————.
10. ඔබ දැනටමත් බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් දරන තනතුර:———————————.
සේවා කාලය:———————————. එම පත්වීම ස්ථිර/තාවකාලික/අනියම් ද යන වග:———————————.
11. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම්:———————————.

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදිවූත් ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

———————————.
අයදුම්කරුගේ අත්සන

දිනය :———————————.

*දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන.......................................... මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ (ස්ථිර/අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත) ............................. දින සිට............................. කු වශයෙන් සේවය කරයි. ඔහු/ඇය අයදුම්කරන තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත්,මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය මොනම ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

———————————.
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :———————————.
තනතුර :———————————.
දෙපාර්තමේන්තුව :———————————.
*(නිල මුද්‍රාව තබන්න)*
දිනය :———————————.

03-831

---

**නියාගම ප්‍රාදේශීය සභාව**

නියාගම ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති දකුණු පළාත් සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *සේවා ගණය හා ශ්‍රේණිය* | *මාසික වැටුප් පරිමාණය හා වැටුප් කේත අංකය* | *බඳවා ගැනීමට අවශ්‍ය අවම සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01 | විදුලි කාර්මික | 01 | ප්‍රාථමික අර්ධ ශිල්පීය III | රු.12,210 - 130 x 10 - 145 x 10- 160 x 10 - 170 x 12 - රු. 18,600<br>PL2- 2006A | (i) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06ක් සමත් විය යුතුය.<br>(ii) අදාළ තනතුරට නියමිත පරිදි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) අවම වශයෙන් දෙවැනි මට්ටමේ නිපුණතාවියක් ලබා තිබීම. අදාළ ක්ෂේත්‍රයේ පලපුරුද්ද අමතර සුදුසුකමකි. |
| 02 | වැඩ/ක්ෂේත්‍ර පරිපාලක | 01 | ද්විතීය III | රු.13,120 - 10 x 145 - 11 x 170 -10 x 240- 10 x 320 -රු.22,040<br>MN-01-2006A | (i) භාෂාව හෝ සාහිත්‍ය සහ ගණිතය විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයන් 06කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගය සමත්ව තිබීම ; සහ<br>(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ..පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් සමත්ව තිබීම. |

02. *පොදු කොන්දේසි :-*

(1) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය;
(2) නියාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ට විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ;
(3) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය (දැනටමත් රජයේ සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.);
(4) අයදුම්කරු යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය;
(5) නියාගම ප්‍රාදේශීය සභාවේ දැනටමත් තාවකාලික/අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ඇති අය සම්බන්ධ විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.;
(6) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතු ය;
(7) මෙම අයදුම්පත් කැඳවීමෙන් පසු ඒ අතරතුර හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම යන මෙම නිවේදනය අවලංගු කිරීම සම්බන්ධයෙන් බලය නියාගම ප්‍රාදේශීය සභාවේ සභාපති සතුවේ;
(8) විදුලි කාර්මික ශිල්පී තනතුර සඳහා අයදුම්කරන අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට සුදුසුකම් පරීක්ෂා කරනු ලබයි.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

(1) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය;
(2) තෝරා ගනු ලබන්නේ අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්වය;
(3) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසි වලට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රෙගුලාසි වලටද දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමියගේ නියෝගවලටද දකුණු පළාත් සභාවේ හෝ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

04. *අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :-*

01. මේ සමග ඇති ආදර්ශ අයදුම්පත් ආකෘතිය අනුව ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත පිළියෙල කර "සභාපති, නියාගම ප්‍රාදේශීය සභාව, පෝද්දිවල, මත්තක" යන ලිපිනයට 2015.04.04. දිනට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

(දැනටමත් රාජ්‍ය සේවයේ සහ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තමා සේවය කරන ආයතනයේ ප්‍රධානියා මාර්ගයෙන් එවිය යුතුය. නියමිත දිනයට පසුව ලැබෙන ඉල්ලුම්පත් නොසලකා හරිනු ලැබේ. සහතිකවල පිටපත් නොමැතිව ඉදිරිපත් කරන ඉල්ලුම්පත් සහ අවශ්‍ය සහතික නොමැතිව ඉදිරිපත් කරන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම්කරන තනතුර සඳහා කළ යුතුය.)

02. අයදුම්පත සමග පහත සඳහන් ලියකියවිලි වල සහතික කළ පිටපත් එවිය යුතුය. මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය.

(i) උප්පැන්න සහතිකය;
(ii) අධ්‍යාපන සහතික;
(iii) අදාළ කාලය තුළ පදිංචිය සනාථ කිරීම පිණිස ග්‍රාම නිලධාරි සහතිකය;
(ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර තිබිය යුතුය.)
(v) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්;
(vii) වෙනත් සුදුසුකම් තිබේ නම් ඒවා සනාථ කිරීමට අවශ්‍ය සහතික.

ප්‍රසාද් වීරක්කොඩි,
නියාගම ප්‍රාදේශීය සභාව,
නියාගම.

2015 මාර්තු මස 06 වැනි දින,
නියාගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**නියාගම ප්‍රාදේශීය සභාව**

.......................................................................................................... *තනතුර සඳහා අයදුම්පත්‍රය*

1. (අ) මුලකුරු සමග නම :————————————.
   (ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් :————————————.
2. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:————————————.
3. ස්ථිර පදිංචි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය :————————————.
4. ස්ථිර ලිපිනය :————————————.
5. ස්ත්‍රී/පුරුෂ භාවය:————————————.
6. උපන් දිනය: ————————————.
7. 2015.04.04 දිනට වයස ඃ අවුරුදු :——————————. මාස:——————————. දින:——————————.
8. ජාතික හැඳුනුම්පත් අංකය :————————————.
9. විවාහක/අවිවාහක බව :————————————.
10. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ උපතින් ද ? ලියාපදිංචි වීමෙන් ද:————————————.
11. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර) :————————————.
12. වෘත්තියමය සුදුසුකම් හා පළපුරුද්ද :————————————.
13. ඔබ දැනටමත් මෙම ආයතනයේ සේවයේ කරන්නේ නම්, සේවා කාලය හා විස්තර :————————————.
    එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/දීමනා පදනම මත ද යන වග) ඃ————————————.
14. සාපරාධී වරදක් සම්බන්ධයෙන් අධිකරණයෙන් වරදකරුවෙකු කර ඇති ද යන වග :————————————.

මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයන ලද ඉතරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය බව මා එම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණ වුවහොත්, මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

————————————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————————————.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන .................................................. මයා/මිය/මෙනවිය/දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ............................................. වශයෙන් සේවය කරයි. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකිය/නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කරමි/නොකරමි.

————————————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :————————————.
පදවි නාමය :————————————.
දෙපාර්තමේන්තුව/ආයතනය :————————————.
දිනය :————————————.

03-854

## පාලින්දනුවර ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු

පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩුවී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා අදාළ අවම සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | රියැදුරු | 01 | රු. 12,210 - 10 x 130 - 10 x 145 -10 x 160 - 12 x 170 - රු. 18,600 (ආරම්භක වැටුප් පියවර) | අයදුම්කරුවන් සඳහා ජාතික පොදු අධ්‍යාපන සහතික පත්‍ර (සා.පෙ.) විභාගයේ දී හෝ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙ.) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්මාන සාමාර්ථ 02ක් සහිතව විෂයයන් 06ක් සමත්වීම.(එක් වරකදී අවම වශයෙන් විෂයයන් 5ක් සමත්ව තිබිය යුතුය.)<br>*වෘත්තීය හෝ වෙනත් සුදුසුකම් :*<br>(i) බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් හා මගීන් 32ට වඩා ගෙන යාමට බලපත්‍ර ඇති බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුනතාවය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතු ය.<br>(ii) අවම උස අඩි 5 අඟල් 6ක් විය යුතු ය.<br>(iii) බඳවා ගැනීමට යෝජිත තනතුරට අදාල අංක i යටතේ සඳහන් බර යන්ත්‍ර ක්‍රියාකරවීම පිළිබඳව රජයේ හෝ පිළිගත් ආයතනයකින් වසරකට නොඅඩු ප්‍රවීනතාවයක් ලබා තිබීම. පිළිගත් ආයතන වශයෙන් රජයේ ආයතනයක්, පළාත් රාජ්‍ය ආයතනයක් , අර්ධ රාජ්‍ය ආයතනයක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ රජයේ ලියාපදිංචි පුද්ගලික ආයතනයක් හැඳින්වේ. |
| 02 | සෞඛ්‍ය කම්කරු | 01 | රු. 11,730 - 10 x 120 - 10 x 130 -10 x 145 - 12 x 160 - රු. 17,600 (ආරම්භක වැටුප් පියවර) | 8 වන ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය. |

02. *අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතු ය. (දැනට රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත අය සඳහා උපරිම වයස් සීමාවක් බලපවත්වන්නේ නැත.).
(ii) අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් හෝ ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතු ය.
(iii) අයදුම්කරු බස්නාහිර පළාත තුළ අවම වශයෙන් අවුරුදු 03ක ස්ථිර පදිංචියක් ඇති අයකු විය යුතු ය. (ඡන්ද හිමි නාමලේඛනය හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරන ලද සහතිකයකින් සනාථ විය යුතු ය.).
(iv) පාලින්දනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි අයදුම්කරුවන් වෙනුවෙන් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.
(v) විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.
(vi) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවකු නොවිය යුතු ය.
(vii) රජයේ පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහකරනු ලැබූවකු නොවිය යුතු ය.
(viii) පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ දැනට ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන සේවකයින් සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.
(ix) අයදුම්කරුවන් ඒ ඒ තනතුර ඉදිරියෙන් දක්වා ඇති අවම සුදුසුකම් සපුරා තිබිය යුතු ය.
(x) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්නයෙන් වසර 05ක සේවා කාලයක් තුළ පාලින්දනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.
(xi) පළාත් රාජ්‍ය සේවයේ හෝ පළාත් පාලන ආයතනයක රාජකාරි ආවරණය කරන්නේ නම් තනතුරට අදාල පළපුරුද්දක් හෝ පුහුණුවක් හෝ ලබා තිබේ නම් එය විශේෂ පුහුණුවක් වශයෙන් සලකනු ලැබේ.

03. *සේවයේ නියුක්ත කරලීමේ කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය.
(ii) පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ.
(iii) මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, රජය හෝ පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හෝ නියෝගවලට ද, අනුකූලව ක්‍රියා කිරීමට සියළු සේවකයින් බැඳී සිටිය යුතු ය.
(iv) සේවයට බැඳුණු භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් සේවයට බැඳී වසර 05ක් තුල ලබා ගත යුතු ය.

04. *බඳවා ගැනීමේ ක්‍රමය* :

(i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/90 අනුව ලිඛිත වෘත්තීය හෝ සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් සපුරා ගැනේ.
(ii) අයදුම්පත්‍ර සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය :-
1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතික ;
3. තම පදිංචිය සනාථ කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය ;
4. මෑතක දී ලබාගත් චරිත සහතික 02ක් ;
5. වෘත්තීය හෝ පළපුරුද්ද තිබේ නම් එම සහතික ;
(රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් නම්, අයදුම්පත් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.)

05. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*අයදුම්පත් එවීම* -

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2015.03.28 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "ලේකම්, පාලින්දනුවර ප්‍රාදේශීය සභාව, පාලින්දනුවර" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීමේ හෝ වෙනස් කිරීමේ හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ ලේකම්වරිය සතු වේ.

පී. ඩී. සෝමලතා,
ලේකම්,
පාලින්දනුවර ප්‍රාදේශීය සභාව.

2015ක් වූ මාර්තු මස 16 වැනි දින,
පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ දී ය.

පාලින්දනුවර ප්‍රාදේශීය සභාව

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ........................................ තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. මුලකුරු සමග නම :——————.
මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————.
02. ස්ථිර පදිංචි ලිපිනය :——————.
03. ස්ථිර ලිපිනය :——————.
04. විවාහක/අවිවාහක බව:——————.
05. ස්ත්‍රී/පුරුෂ භාවය : ——————.
06. උපන් දිනය: අවුරුද්ද :——————. මාසය:——————. දිනය:——————.
07. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද? ලියාපදිංචි වීමෙන් ද? :——————.
08. අධ්‍යාපන සුදුසුකම් :
අ.පො.ස. (සා.පෙළ) විභාගය :——————.
සමත් වූ වර්ෂය හා විභාග අංකය :——————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

වෙනත් සුදුසුකම් : ——————.
09. වෘත්තීය සුදුසුකම් : ——————.
10. සේවා පළපුරුද්ද : ——————.

(i) දැනට සේවය කරන ආයතනය:——————.
(ii) දැනට දරන තනතුර:——————.
(iii) එම තනතුරට පත්වූ දිනය:——————.
(iv) පෙර සේවය කරන ලද ස්ථානයේ දරන ලද තනතුර:——————.

——————,
අයදුම්කරුගේ අත්සන.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පහත ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ........................................................ මයා/මිය/මෙනවිය මෙම ආයතනයේ ..................................... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය. ඔහු/ඇය මොන ආකාරයේ හෝ නීත්‍යානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

―――――――,
ආයතන ප්‍රධානියා.

නම :――――――――.
පදවි නාමය:――――――――.
දෙපාර්තමේන්තුව/ආයතනය :――――――――.

03-177

---

## නිවැරදි කිරීමයි

### හම්බන්තොට මහා නගර සභාව

2015.03.13 වැනි දින පළකරන ලද අංක 1906 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) - තනතුරු ඇබෑර්තු යටතේ පළකරන නිවේදනයේ අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2015.04.06 දක්වා දීර්ඝ කරනු ලැබේ.

ටී. ඩබ්. කේ. රූපසේන,
නාගරික ලේකම්,
හම්බන්තොට මහා නගර සභාව.

2015 මාර්තු මස 17 වැනි දින,
හම්බන්තොට මහ නගර සභා කාර්යාලයේ දී ය.

03-893

---

## නිවැරදි කිරීමයි

### මාතර ප්‍රාදේශීය සභාව

2015.02.13 වැනි දින අංක 1902 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) - තනතුරු ඇබෑර්තු යටතේ 02-309 දරන නිවේදනයේ තනතුරු සඳහා අදාල වැටුප් පරිමාණය

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *මාසික වැටුප් පරිමාණය* |
|---|---|---|---|
| 03. | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 01 | රා.ප.ච. 06/2006 අනුව MN1-2006A |
| 04. | සෞඛ්‍ය කම්කරු | 01 | රා.ප.ච. 06/2006 අනුව MN1-2006A |
| 05. | ආදාහනාගාර ක්‍රියාකරු | 01 | රා.ප.ච. 06/2006 අනුව MN2-2006A |
| 06. | ආදාහනාගාර සහායක | 01 | රා.ප.ච. 06/2006 අනුවMN 1-2006A |
| 07. | ජල වැද්දුම්කරු | 01 | රා. ප. ච. 06/2006 අනුව MN2-2006A |

ලෙස පළවී ඇත. එය පහත සඳහන් ආකාරයට නිවැරදි විය යුතු ය.

| | | | |
|---|---|---|---|
| 03. | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 01 | රා.ප.ච. 06/2006 අනුව PL1-2006-A |
| 04. | සෞඛ්‍ය කම්කරු | 01 | රා.ප.ච. 06/2006 අනුව PL1-2006-A |

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | මාසික වැටුප් පරිමාණය |
|---|---|---|---|
| 05. | ආදාහනාගාර ක්‍රියාකරු | 01 | රා.ප.ච. 06/2006 අනුව PL2-2006-A |
| 06. | ආදාහනාගාර සහායක | 01 | රා.ප.ච. 06/2006 අනුව PL1-2006-A |
| 07. | ජල වැද්දුම්කරු | 01 | රා. ප. ච. 06/2006 අනුව PL2-2006-A |

පී. ජී. පියල් රණදේව,
ලේකම්,
මාතර ප්‍රාදේශීය සභාව.

2015 මාර්තු මස 21 වැනි දින,
මාතර ප්‍රාදේශීය සභාව,
මාතර.

03-894

---

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## හැටන් - දික්ඔය නගර සභාව

### හැටන් පොදු වෙළඳ පොල ප්‍රදේශයේ කඩ කාමර ඉදිකිරීම සඳහා බදු පදනම මත ඉඩම් ලබාදීම

මෙම සභාවට අයත් හැටන් පොදු වෙළඳපොල ප්‍රදේශයේ කඩ කාමර 16ක් ඉදිකිරීම සඳහා බදු පදනම මත ඉඩම් ලබාදීමට සභාව විසින් තීරණය කර ඇත. ඒ සඳහා මුද්‍රා කරන ලද ටෙන්ඩර් අයදුම්පත් 2015.04.21 දින පෙ. ව. 9.30 දක්වා මා විසින් භාරගනු ලැබේ.

02. ටෙන්ඩර් අයදුම්පත් - 2015.04.20 ප.ව. 2.30ට පෙර අයදුම්පත් ගාස්තු හා නැවත ලබාදෙන තැන්පත් මුදල් ගෙවා නගර සභා කාර්යාලයෙන් ලබාගත හැකිය.
03. ආපසු නොගෙවන ටෙන්ඩර් පෝරම ගාස්තු - රු. 5,000 +VAT+NBT
04. ටෙන්ඩර් මුදල - රු. 2,50,000 + VAT+NBT
    වැඩිම මුදලට කරනු ලබන ඉල්ලීම සළකා බලනු ලැබේ.
05. නැවත ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පත් මුදල - රු. 20,000
06. කඩ කාමරයේ ප්‍රමාණය - වර්ග අඩි 100
07. කඩ කාමරය පරීක්ෂා කිරීම - සතියේ වැඩකරන වේලාවන් තුළදී පරීක්ෂා කර බැලීමට හැකිය.
08. මාසික කුලිය - රජයේ තක්සේරුකරු විසින් කරනු ලබන තක්සේරුව අනුව මාසික කුලී මුදල් ගෙවිය යුතුය.
09. බදු කාලය - දීර්ඝ කාලීන බදු පදනම මත ලබාදෙන අතර 2013.09.01 දින සිට බදු කාලය ආරම්භ වීමට නියමිතය.
10. ටෙන්ඩර් විවෘත කිරීම - 2015.04.21 වැනි දින පෙ.ව. 10.00ට නගර සභා රැස්වීම් ශාලාවේ දී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.
11. සියලුම ටෙන්ඩර් අයදුම්පත් මුල් පිටපත හා අනුපිටපත වෙන වෙනම ඉදිරිපත් කළ යුතු අතර ලියුම් කවරයේ ඉහළ කෙළවර වම්පස "පොදු වෙළඳපොල ප්‍රදේශයේ කඩ කාමර 16ක් ඉදිකිරීම සඳහා බදු පදනම මත ඉඩම් ලබාදීමට" ලෙස සඳහන් කර සභාපති, හැටන් දික්ඔය නගර සභාව, හැටන් යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ නගර සභාවේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය.
12. ටෙන්ඩර් කමිටුවේ තීරණය අවසන් තීරණය වේ.
13. පිළිගත් ටෙන්ඩර්කරු විසින් මුලු මුදලම ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී එකවර ගෙවිය යුතුය.
14. වැඩි විස්තර හැටන් දික්ඔය නගර සභාවේ සභාපති/ලේකම් ගෙන් ලබාගත හැකිය 051-2222275/0512222276.

වෛද්‍ය අලගමුත්තු නන්දකුමාර්,
සභාපති,
හැටන් - දික්ඔය නගර සභාව.

2015 මාර්තු මස 04 වැනි දින,
හැටන් - දික්ඔය නගර සභා කාර්යාලයේ දී ය.

03-664

# පළාත් පාලන නිවේදන

## කෑගල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(61) ආ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1)ආ වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් 24(1) ආ වගන්තිය ප්‍රකාරව පහත සඳහන් උපලේඛනයේ සඳහන් මාර්ග කෑගල්ල ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.


මෙම මාවත් සළකුණු කරනු ලැබ ඇත්තේ යම් ඉඩමක් හරහා ද එම ඉඩමේ අයිතිකරු ලෙස හිමිකම් පාන යම් පාර්ශ්වයක් වේ නම් මෙම දැන්වීම පළ කළ දින සිට මාස 03ක කාලයක් තුළ එම ඉඩමට ඇති අයිතිය ඔප්පු කිරීම සඳහා නිසි අධිකරණයෙහි නඩුවක් පවරා විරෝධතා ඉදිරිපත් කළ යුතු බව ප්‍රාදේශීය සභා පනතේ 24 (2) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩී. එම්. උපාලි දිසානායක,
සභාපති,
කෑගල්ල ප්‍රාදේශීය සභාව,
බුළුරුප්ප, හෙට්ටිමුල්ල.

පාරේ නම :- කවුඩුගම වෙලමැදින් දිවෙන සමගි මාවත
පාරේ දිග :- මීටර් 103
පාරේ පළල :- මීටර් 3.125

*ඉඩම් හිමියන් :*

| *අනු. අංකය* | *වම* | *අනු. අංකය* | *දකුණ* |
|---|---|---|---|
| 01 | ඉඳුනිල් අබේරත්න<br>88/1බී, කවුඩුගම, හෙට්ටිමුල්ල | 01 | ගුන්නෑපාල සොමරත්න හිමි<br>රජමහ විහාරය, කවුඩුගම, හෙට්ටිමුල්ල |
| 02 | ඩබ්. ඒ. සිරිරත්න<br>සී/116, කවුඩුගම, හෙට්ටිමුල්ල | | |
| 03 | ඩබ්. ඒ. ජානක චමින්ද බණ්ඩාර<br>සී/118, කවුඩුගම, හෙට්ටිමුල්ල | | |
| 04 | පී. ජී. ආර්. ලලිත් කරුණාතිස්ස, සී/88 ඒ<br>කවුඩුගම, හෙට්ටිමුල්ල. | | |
| 05 | පී. ජී. ආර්. නිහාල් කරුණාතිස්ස, සී 88,2 ඒ<br>කවුඩුගම, හෙට්ටිමුල්ල. | | |


Telephone No: 035-2278728
LSC Reg. No. 19991017
From Naranpitiya Road (PS)
To Evunugalle
Rukmale Kumbura of H.R.E.Abeyrathne
Rukmale Kumbura of H.R.E.Abeyrathne
Ela
Egodahawaththe of Sirirathne
Land of Kawudugama Temple
Pahalawaththe of Janaka Chaminda Bandara
Hitinawaththe of P.C.R.N. Karunathissa
Udahawaththe
Reference:-
ST- Stake
( PS) - Pradeseeya Sabha
Reference:-
Scale :- 1:1000
PLAN
Shown ,The Road, From Naranpitiya - Evunugalle Pradeseeya Sabha Road
up to Udahawaththe Named "Samagi Mawatha"
situated at Kawudugama Village , in Mawatha Pattu
in 53 A Kawudugama GS Division in
Divisional Secretariet Division of Kegalle
within the Pradeseeya Sabha Limits of Kegalle
Paranakuru Korale Kegalle District
SABARAGAMUWA PROVINCE
Length of the Road 103.0 M 330 ft.
Width of Road 3.125 M 10 ft.
Bounded as described above
ලේකම්
කෑගල්ල ප්‍රාදේශීය සභාව
P.P.C. Jayasena
Licensed Surveyor
& Court Commissioner
Licensed Surveyor

**කෑගල්ල ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) ආ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ "24(1)ආ " වගන්තිය ප්‍රකාරව කටයුතු කරමින් "24(1)ආ" වගන්තිය ප්‍රකාරව පහත සඳහන් උපලේඛනයේ සඳහන් මාර්ග කෑගල්ල ප්‍රාදේශීය සභාව සතු මාර්ග ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මෙම මාවත් සළකුණු කරනු ලැබ ඇත්තේ යම් ඉඩමක් හරහා ද එම ඉඩමේ අයිතිකරු ලෙස හිමිකම් පාන යම් පාර්ශ්වයක් වේනම් මෙම දැන්වීම පළකළ දින සිට මාස 03ක කාලයක් තුළ එම ඉඩමට ඇති අයිතිය ඔප්පු කිරීම සඳහා නිසි අධිකරණයෙහි නඩුවක් පවරා විරෝධතා ඉදිරිපත් කළ යුතු බව ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙනු ලැබේ.


ඩී. එම්. උපාලි දිසානායක,
සභාපති,
කෑගල්ල ප්‍රාදේශීය සභාව,
බුළුරුප්ප, හෙට්ටිමුල්ල.

පාරේ නම ඃ ඌරාඋල්ල වත්ත මාර්ගය
පාරේ දිග මීටර් 166
පාරේ පළල ඃ- අඩි 8

**ඉඩම් හිමියන්**

| *අනු අංකය* | *වම* | *අනු අංකය* | *දකුණ* |
|---|---|---|---|
| 01 | යූ. ජී. ජයරත්න - මඩුගහමුලතැන්න | 01 | ජානකීරත්න කුමාරි - මඩුගහමුලතැන්න |
| 02 | ලතා වෛද්‍යරත්න - මැදවත්ත හේන | 02 | ලතා වෛද්‍යරත්න - මැදවත්ත හේන |
| | | 03 | බී. ආර්. තිලකාවතී - පිටකොටුව |
| | | 04 | යූ. ජී. ලාලිත - පිටකොටුව |
| | | 05 | එන්. ගාමිණී ගුණසිංහ, ඌරාඋල්ල වත්ත. |

# උපුරාඋල්ල වත්ත මාර්ගය




පරිමාණය 1: 1000

**විස්තරය**

| | |
|---|---|
| කොක | කොන්ක්‍රීට් කණුව |
| ක | මායිම් කණුව |
| ඉ | ඉවුර |
| ගබැ | ගල් බැම්ම |
| කපැවැ | කම්බි පැළඟුණු වැට |
| ආතා | ආධාරක තාප්පය |
| අවි | අවිනිශ්චිත |
| අපා | අඩි පාර |
| මාර්ග(ප්‍රාස) | මාර්ගය(මාර්ග ප්‍රාදේශීය සභා) |

සබරගමුව පළාතේ

කෑගල්ල දිස්ත්‍රික්කයේ පරණකුරු කෝරළයේ මාවත පත්තුවේ කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ

අංක 52 B ඌරාඋල්ල ග්‍රාම නිළධාරී කොට්ඨාශය තුළ ඌරාඋල්ල ගමේ පිහිටි "ඌරාඋල්ල වත්ත පාර"

අඩි අටක්(8) පළලට සහ මීටර් 166 ක් දිගට මැන දැක්වෙන පිඹුර

## පිඹුර

| කැබැලි අංකය | බිම් ප්‍රමාණය | | | |
|---|---|---|---|---|
| | අ. | රූ. | පර්. | හෙක්ටයාර් |
| 1 | 0 | 0 | 15.7 | 0.0398 |
| එකතුව | 0 | 0 | 15.7 | 0.0398 |

| | අ. | රූ. | පර්. | හෙක්ටාර් |
|---|---|---|---|---|
| සම්පූර්ණ බිම් ප්‍රමාණය | 0 | 0 | 15.7 | 0.0398 |

සැබෑ පිටපතකි.

..............................

ලේකම්
කෑගල්ල ප්‍රාදේශීය සභාව

ආර්.ඩී. ධර්මසේන
ලියාපදිංචි මිනින්දෝරු
7/7, උසාවිය පාර,
කෑගල්ල.

මැනීම හා
බෙදීම කළේ 2012.12.20

03-852

## හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් හෝ යම් විරුද්ධත්වයක් පළකරනු ලබන්නේ නම් මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට එක් මසක් ඇතුළත තමනගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්ති ප්‍රකාර ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාල සීමාව තුළ මෙම නිවේදනය පිළිබඳව යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුවහොත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(3) වගන්තිය යටතේ උපලේඛනයෙ 'සඳහන් මංමාවත් හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව සතු මාර්ග වශයෙන් ස්ථිර වශයෙන්ම පාලනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. ඒ. ආනන්ද ජයවිලාල්,
සභාපති,
හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාව.

2015 පෙබරවාරි මස 10 වැනි දින.

මාර්ගයේ නම :- මහකුඹුර ගලගාව පාර
මාර්ගයේ ආරම්භය :- මැදකුඹුර පැරණි අම්බලම අසලින්
මාර්ගයේ අවසානය - සිංහ ශ්‍රමදාන මාවත
මායිම් විස්තර -

| *වම්පස* | *දකුණු පස* | *දිග(අඩි)* | *පළල(අඩි)* |
|---|---|---|---|
| අස්ගිරි මහ විහාරයට අයත් බොකලවෙල මහකුඹුර ඉඩම | ඩී. එල්. සුරේෂ් ඉන්දිකට අයත් මොහොට්ටි ගෙදර වත්ත | | |
| එච්. එම්. විජේරත්නට අයත් දඹගහකුඹුර | පී. ඩබ්ලිව්. විජිතා කුමාරිට අයත් ගලහිටියාන හේන | | |
| එස්. බී. විජේරත්නට අයත් ගලහිටියාව කුඹුර | කොණ්ඩදෙණිය විහාරයට අයත් අටුගෙදරවත්ත | | |
| පී. ජී. ඥානවතීට අයත් දඹගහකුඹුර | ඩී. ජී. ශීලා චන්ද්‍රලතාට අයත් මොහොට්ටිගෙදරවත්ත | 1550 | 10 |
| ජී. කේ. දිසාසේකරට අයත් ගලහිටියාව කුඹුර | ඩබ්ලිව්. ඇම්. ඇම්. කේ. තිලකරත්නට අයත් දොරකඩලියද්ද | | |
| පී. ඩබ්ලිව්. බණ්ඩාරණායකට අයත් දඹගහකුඹුර | ඩබ්ලිව්. එම්. එම්. කේ. තිලකරත්නට අයත් දොරකඩවල | | |

03-666

---

## කොළොන්නාව නගර සභාව

කොළොන්නාව නගර සභාවේ සභාපති, ඩී. ජී. රවීන්ද්‍ර උදයශාන්ත වන මා විසින් 255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ III වන කොටසේ 44(1) සහ 46 වන වගන්ති මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බලයලත් මිනින්දෝරු කේ. එම්. ඩී. පාලිත මහතා විසින් මැනීම් කර පිඹුරුපත් සකසා ඇති කොළොන්නාව නගර සභා පරිපාලන සීමාව ඇතුළත වූ පහත මාර්ග සම්බන්ධව සියලු බලතල සහිත පොදු පරිපාලන අධිකාරිය කොළොන්නාව නගර සභාව විය යුතු බවත්, එම මාර්ග සම්බන්ධව කොළොන්නාව නගර සභාව පොදු බලධරයා වන බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

සභාපති,
කොළොන්නාව නගර සභාව.

2015 පෙබරවාරි මස 13 වැනි දින,
කොළොන්නාව නගර සභාවේ දී ය.

| අනු. අංකය | සැලසුම් අංකය හා දිනය | මාර්ගයේ නම | මාර්ගයේ වර්ග ප්‍රමාණය | මාර්ගයේ පළල | උපලේඛනය අනුව සීමාවන් |
|---|---|---|---|---|---|
| 01 | සැලසුම් අංක 228 2014.07.01 | සාලවත්ත පටුමග | හෙක්ටයාර් 0.1650 | - | උතුරට - සාලවත්ත පාර සහ කොලොන්නාව පාරට මායිම් වන වරිපනම් අංක 264,262,260,258, 258ඒ,258බී සහ 256 දරන දේපළ හා සාලවත්ත පටුමගට 2014.07.17 මායිම් වන වරිපනම් අංක 1ඒ,7,1සී,6,15,16,16/1, 19/1,21,25,26/1,41 දරන දේපළ<br><br>දකුණට - සාලවත්ත පාර සහ සාලවත්ත පටුමගට මායිම් වන වරිපනම් අංක 1,1ඒ,7,1සී,12,15,19/1,21,25,26/1,31 සහ 41 දරන දේපළ හා එච්. කේ. පෙරේරා යන අයට අයත් දේපළ සහ සෙසු දේපළ හා ශ්‍රී සුමනාරාම පන්සල සහ පාරට මායිම්ව<br><br>නැගෙනහිරට - සාලවත්ත පටුමගට මායිම් වන වරිපනම් අංක 1,1ඒ,4,6,8,10,10ඒ,12,16,16/1,25 සහ 31 දරන දේපළ සහ සිරිල් බාලසූරිය, එච්.කේ. පෙරේරා යන අයට අයත් දේපළ හා සෙසු දේපළ සහ ශ්‍රී සුමනාරාමය පන්සලට මායිම්ව<br><br>බටහිරට - කොලොන්නාව පාර, කොලොන්නාව පාරට මායිම් වන වරිපනම් අංක 264 දරන දේපළ සහ සාලවත්ත පටුමගට මායිම් වන වරිපනම් අංක 4,6,8,10,10ඒ 16 සහ 16/1 දරන දේපළ සහ සිරිල් බාලසූරිය, එම්. ඩබ්. ඒ. නිලංක සම්පත් යන අයට අයත් දේපළ, සෙසු දේපල සහ පුවක්ගහවත්ත පාර |
| 02 | සැලසුම් අංක 229 2014.07.07 | කුමාරතුංග මුණිදාස මාවත | හෙක්ටයාර් 0.1231 | - | උතුරට - කුමාරතුංග මුණිදාස මාවතට මායිම් වන වරිපනම් අංක 23,25 29,35,39 සහ 41 දරන දේපළ, වීරසිංහ මල්ලිමාරච්චි මාවත<br><br>නැගෙනහිරට - කොලොන්නාව පාරට මායිම් වන වරිපනම් අංක 126 දරන දේපළ, කුමාරතුංග මුණිදාස මාවතට මායිම් වන වරිපනම් අංක 3ඒ,3,3ඒ/1, 3බී,5,5ඒ, 11,15,15/1,15බී,19,21,30,36,38,40,44,45,48,50 දරන දේපළ සහ සමන් විමලසිරි යන අයට අයත් දේපළ<br><br>දකුණට - කුමාරතුංග මුණිදාස මාවතට මායිම් වන වරිපනම් අංක 30,36,38,40,44,45,46,48 සහ 50 දරන දේපළ සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් දේපළ<br><br>බටහිරට - කොලොන්නාව පාරට මායිම් වන වරිපනම් අංක 110/1/1, 120, සහ 96/2 දරන දේපළ සහ කුමාරතුංග මුණිදාස මාවතට මායිම් වන වරිපනම් අංක 4,6,10,12,18,25,26බී,26සී හා ඒ. ආර්. ඒ. කල්දේරා යන අයට අයත් දේපළ |

03-651

---

## කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව

### මාර්ග නම් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව හා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතිය ලැබූ පහත උපලේඛනයේ සඳහන් මාර්ගයන් පහත සඳහන් අයුරින් නම් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**උපලේඛනය**

| *අනු අංකය* | *පැවති නාමය* | *යෝජිත නම* | *සභා තීරණය* |
|---|---|---|---|
| 01 | කුඹුක්වැව මංසන්ධියේ සිට ගලටබැදිවැව කුඹුරුයාය දක්වා ඇති මාර්ගය | සණස මාවත | 2014.08.28 තීරණ අංකය 4-xxvi |
| 02 | මොරගහවැව ඇහැටුවැව මාර්ගය | විදුහල්පති කේ. ඒ. එස්. කස්තුරිරත්න මාවත | 2014.08.28 තීරණ අංකය 4-xxiv |

එච්. ඒ. යූ. ඩී. හෙට්ටිආරච්චි,
සභාපති,
කොබෙයිගනේ ප්‍රාදේශීය සභාව.

03-765

### බලතල පැවරීම

පහත දැක්වෙන අතුරු ව්‍යවස්ථා පනත් හා ආඥා පනත් වලින් රත්නපුර ප්‍රාදේශීය සභාවට හා සභාපතිවරයාට පැවරී ඇති බලතල 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 8(2) වගන්තිය යටතේ හා 216 වගන්තිය යටතේ පැවරී ඇති ප්‍රතිපාදන අනුව පහත නිලධාරීන්ට පවරන බව මෙයින් ප්‍රකාශයට පත් කෙරනු ඇත.

*මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාගේ නම*

01. සී. පී. ඩබ්ලිව්. විතානගේ මයා කහංගම/ඇත්ඔය
02. ඩී. ඒ. ඒ. එස්. දිසානායක මයා මලංගම
03. ජී. කේ. එල්. පුෂ්ප කුමාර මයා බානගොඩ
04. එස්. පී. කුමාර් මයා ශ්‍රී පළාබද්දල
05. ඒ. එල්. පී. ජයන්ත කුමාර මයා මල්වල

*බලතල පවරණු ලබන අතුරු ව්‍යවස්ථා, පනත් සහ ආඥා පනත්*

i. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ iv කොටසේ මහජන සෞඛ්‍යට අදාළ කොටස් සහ සභාපතිවරයා විසින් අවස්ථානුකූලව පවරනු ලබන අනෙකුත් වගන්ති
ii. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 (1) වගන්තියෙහි (xxv), (xxx), (xxxi), උප වගන්තිය
iii. 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත යටතේ සාදන ලද අංක 520/7 දරන 1988.08.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද අතුරු ව්‍යවස්ථා
iv. රත්නපුර ප්‍රාදේශීය සභාව විසින් පනවා ඇති අනෙකුත් අතුරු ව්‍යවස්ථාවල මහජන සෞඛ්‍යට අදාල කොටස්
v. 230 වන අධිකාරිය වූ පීඩන ක්‍රියා ආඥා පනත
vi. 1893 අංක 09 දරන ගෝඝාතක ආඥා පනත
vii. 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ පරිසර දූෂණයන්ට අදාල හා පරිසර බලපත්‍ර වලට අදාල කරුණු පරීක්ෂා කිරීම, වාර්තා කිරීම හා අවශ්‍ය විටෙක සභාපති හෝ ලේකම් වෙනුවෙන් අධිකරණයෙහි පෙනී සිටීම.
viii. පුද්ගලික සුසාන හෝ පොදු සුසාන පිළිබඳ ආඥා පනත
ix. 268 වන අධිකාරිය වූ ගෘහ හා නගර සංවර්ධන ආඥා පනත
x. 1941 අංක 13 දරන ජල භීතිකා රෝගය පිළිබඳ ආඥා පනත
xi. 1838 අංක 26 දරන බල්ලන් ලියා පදිංචි කිරීමේ ආඥා පනත
xii. උත්සව හා වන්දනා ගමන් පිළිබඳ ආඥා පනත

බන්දුල එස් කරවිට,
සභාපති,
රත්නපුර ප්‍රාදේශීය සභාව.

2015 මාර්තු මස 03 වැනි දින,
රත්නපුර ප්‍රාදේශීය සභාව,
ගිලීමලේ.

03-702

---

## විවිධ දැන්වීම්

### වලපනේ ප්‍රාදේශීය සභාව

2015 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 153 (1) වැනි වගන්තිය ප්‍රකාරව වලපනේ ප්‍රාදේශීය සභා බල සීමාව තුළ පිහිටි ගොඩනැගිලි ඉදි කිරීමට හෝ ස්ථාවර නැතහොත් නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසු යම් ඉඩමක,

(අ) ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැතිනම් හෝ,
(ආ) ඒ ඉඩම විධිමත් ලෙස හෝ නිත්‍ය ලෙස වගා කිරීමට යටත් කර නොමැති විටක හෝ,
(ඇ) ඒ ඉඩමේ ඉදිකර ඇති ගොඩනැගිලිවලට ඇත්ත වශයෙන්ම යට වී ඇති බිම් ප්‍රමාණය සහ ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතයට වඩා අඩු වන්නේ නම්

එකී ඉඩම සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකීමට සහ එවැනි සංවර්ධනය නොකළ ඉඩමක් වශයෙන් සැලකෙන ඉඩම් මත 2015 වර්ෂය සඳහා ඒ එක් එක් ඉඩමේ භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට එකක වාර්ෂික බද්දක් පැනවීමටත්, එකී සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද 2015 වර්ෂයේ අප්‍රේල් මස 30 වැනි දිනට පෙර වලපනේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවත්, 2014.12.15 වැනි දින මහ සභාවෙන් තීරණ අංක2.2.6 සභා සම්මුතිය යටතේ තීරණය කළ බව මෙයින් දැනුම් දෙමි.

ප්‍රාදේශීය සභාව වෙනුවෙන්,

සභාපති,
වලපනේ ප්‍රාදේශීය සභාව.

2014ක් වූ දෙසැම්බර් මස 15 වැනි දින,
වලපනේ ප්‍රාදේශීය සභාව,
වලපනේ.

03-843/8

### වලපනේ ප්‍රාදේශීය සභාව

2015 වර්ෂය සඳහා ඇතැම් වෙළඳ ව්‍යාපාර හා වෘත්තීන් සම්බන්ධ බදු - 152 වගන්තිය යටතේ

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තිය යටතේ 2015 වර්ෂය සඳහා වලපනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවතින පහත සඳහන් ඇතැම් ව්‍යාපාර හා වෘත්තීන් සම්බන්ධ බදු ගෙවිය යුතු වර්ෂයට ඉහතින් (පෙර) වර්ෂයේ ලැබීම්/ආදායම්වලට අනුකූලව (පදනම්ව) වාර්ෂික බද්දක් 2015 වර්ෂය සඳහා 2015 අප්‍රේල් මස පළමු වැනි දිනට ප්‍රථම ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බවත් 2015 ජනවාරි මස 01 වැනි දින ක්‍රියාත්මක විය යුතු බවත් මෙයින් දැනුම් දෙමි.

| | *ව්‍යාපාරයේ වාර්ෂික වටිනාකම* | *ගෙවිය යුතු වාර්ෂික බද්ද* *රු. ශ.* |
|---|---|---|
| 01. | රු. 6,000ට වැඩි රු. 12,000ට අඩු | 90 0 |
| 02. | රු. 12,000ට වැඩි රු. 18,750ට අඩු | 180 0 |
| 03. | රු. 18,750ට වැඩි රු. 75,000ට අඩු | 360 0 |
| 04. | රු. 75,000ට වැඩි රු. 1,50,000ට අඩු | 1,200 0 |
| 05. | රු. 1,50,000ට වැඩි | 3,000 0 |

#### උපලේඛනය අංක 01

1. කොමිස් කටයුතු.
2. බ්‍රෝකර් කටයුතු.
3. මුදල් ණයට දීම.
4. උකස් බඩු ගැනීම.
5. සැපයුම් කටයුතු.
6. ප්‍රවාහන කටයුතු.
7. මෝටර් රථ වෙළඳාම.
8. රියැදුරු පුහුණු ආයතන.
9. වෙන්දේසි කටයුතු.
10. මුදල් ආයෝජන.
11. කොන්ත්‍රාත් කටයුතු.
12. රක්ෂණ කටයුතු.
13. මුල්‍ය ආයතන, බැංකු හා රක්ෂණ සමාගම්.
14. නීතිඥවරු,ප්‍රසිද්ධ නොතාරිස්වරු පෞද්ගලික . වෛද්‍යවරු, මිනින්දෝරුවරු.
15. මත්පැන් වර්ග - බියර් සාප්පු රට බීම සාප්පු.
16. රා තැබෑරුම්.
17. සන්නිවේදන මධ්‍යස්ථාන.
18. සන්නිවේදන කුළුණු.
19. තේ දළු ඇඹරීමේ කර්මාන්ත ශාලා.
20. කුඩා පරිමාණ ජල විදුලි බලාගාර.
21. රැකියා ඒජන්සි.
22. අලෙවි නියෝජිතවරු
23. විදුලි උපකරණ අලෙවිය.
24. සාප්පු බඩු අලෙවිය.
25. ගෘහ භාණ්ඩ අලෙවිය.
26. හාඩ්වෙයාර් ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිය.
27. පෞද්ගලික පන්ති පවත්වන්නෝ.
28. ගණන් පරීක්ෂකවරු.
29. ගෘහ නිර්මාණ ශිල්පීන්.
30. ඇඟලුම් කර්මාන්තශාලා

සභාපති,
වලපනේ ප්‍රාදේශීය සභාව.

2014 දෙසැම්බර් මස 15 වැනි දින,
වලපනේ ප්‍රාදේශීය සභාව,
වලපනේ.

03-843/3

---

### වලපනේ ප්‍රාදේශීය සභාව

ගොඩනැගිලි පරීක්ෂණ ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 21,49,78 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාරව 1988.08.23 වැනි දින අංක 520/7 දරන පළාත් පාලන අති විශෙෂ ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත් කරනු ලදුව (260 වැනි අධිකාරය) වන නිවාස හා නගර සංවර්ධන ආඥා පනතේ වගන්තිවලින් පැවරී ඇති බලතල ප්‍රකාරව 2015.01.01 දින සිට බල පැවැත්වෙන පරිදි වලපනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමාව තුළ ගොඩනැගිලි ඉදිකිරීම හා අනවසර ඉදිකිරීම් සඳහා පහත උපලේඛනයේ සඳහන් ගාස්තු නැවත සංශෝධනය කරන තුරු මෙම සභාවට ගෙවිය යුතු බවත් 2014.12.15 වැනි දින මහ සභාවේ තීරණ අංක 2.2.7 යටතේ තීරණය කළ බවත් මෙම බදු මුදල් එකී කාර්තුව අවසන් වීමට පෙර ගෙවිය යුතු බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ප්‍රාදේශීය සභාව වෙනුවෙන්,

සභාපති,
වලපනේ ප්‍රාදේශීය සභාව.

වලපනේ ප්‍රාදේශීය සභාව,
වලපනේ.

#### උපලේඛනය

01. ගෘහස්ථ ඉදිකිරීම් - පළමු වර්ග අඩි 100ට රු. 250ක් හා ඊට වැඩිවන සෑම වර්ග අඩි 100කටම රු. 50 බැගින්.

02. ව්‍යාපාර ඉදිකිරීම් - ව්‍යාපාර ඉදිකිරීම සඳහා පළමු වර්ග අඩි 100ට රු. 500 ක් හා ඊට වැඩිවන සෑම වර්ග අඩි 100ක ටම රු. 100 බැගින්

03-843/6

---

### වලපනේ ප්‍රාදේශීය සභාව

2015 වර්ෂය සඳහා කර්මාන්ත බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව -

*(අ)* වලපනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2015 වර්ෂයේ දී පවත්වාගෙන යනු ලබන මෙහි පහත උපලේඛනයේ 1 වැනි තීරයේ නිරූපිත යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් එම කර්මාන්තය කරගෙන යනු ලබන පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම එම උපලේඛනයේ 11 වැනි තීරයේ අනුරූප සටහනේ නිරූපිත අනුප්‍රමාණ අනුව කර්මාන්ත බද්දක් 2015 වර්ෂයේදී පනවා අයකිරීමට,

*(ආ)* 2015 වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින පැවති යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් වූ විට යථොක්ත බද්ද 2015 අප්‍රේල් මස පළමු වැනි දිනට ප්‍රථම කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි විධානය කිරීමට,

*(ඇ)* 2015 වර්ෂයේ දී ආරම්භ කරනු ලබන යම් කර්මාන්තයක් සම්බන්ධයෙන් වූ විට යථොක්ත බද්ද කර්මාන්තය ආරම්භකර මාස 03ක් ඇතුළත කර්මාන්තය කරගෙන යනු ලබන තැනැත්තා විසින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි විධානය

කිරීමටත් 2014.12.15 දින මහ සභාවෙන් තීරණ අංක 2.2.8 සහා සම්මුතිය යටතේ තීරණය කළ බව මෙයින් දැනුම් දෙමි.

ප්‍රාදේශීය සභාව වෙනුවෙන්,

සභාපති,
වලපනේ ප්‍රාදේශීය සභාව.

2014 ක් වූ දෙසැම්බර් මස 15 වැනි දින,
වලපනේ ප්‍රාදේශීය සභාව,
වලපනේ.

**උපලේඛන අංක 01**

***1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තිය යටතේ පැනවෙන කර්මාන්ත බදු ගාස්තු***

| | *ව්‍යාපාරයේ නම* | *වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන* | *වාර්ෂික වටිනාකම රු. 750 ඉක්මවන රු.1,500 නොඉක්මවන* | *වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන අවස්ථාව* |
|---|---|---|---|---|
| | | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| 01. | ස්වර්ණාභරණ නිපදවීම හෝ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යාම | 600 0 | 750 0 | 1,000 0 |
| 03. | කම්මලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 04. | මෝටර් වාහන හෝ ලොරි බොඩි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 700 0 |
| 05. | කළුගල් පිපිරවීම හෝ කැණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | ගඩොල් නිපදවීම ,ඇහිරීම හෝ ඔප දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | වී මෝලක් පවත්වාගෙන යාම (යකඩ) | 500 0 | 700 0 | 1,000 0 |
| 08. | වී මෝලක් පවත්වාගෙන යාම (රබර්) | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | බිත්තර සහ මස් පිණිස කුකුළන් 100ට වැඩි කුකුල් කොටුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | ගෘහ භාණ්ඩ නිපදවීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | දර මඩුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 13. | ධාන්‍ය ඇඹරීමේ (මිරිස්, තුනපහ) ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | සුරුට්ටු, බීඩි නිෂ්පාදන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | පොල්තෙල් නිෂ්පාදනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | බ්ලොක් ගල් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 800 0 |
| 17. | අයිස්ක්‍රීම්, යෝගට් නිපදවීම හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | අයිස් පැකට් කර්මාන්තය | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | සබන් නිෂ්පාදනය | 600 0 | 750 0 | 1,000 0 |
| 20. | සම්භාණ්ඩ නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | රස කැවිලි වර්ග නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 700 0 |
| 22. | සත්ත්ව ආහාර හෝ කුකුල් කෑම නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | සිරප් හෝ පළතුරු බීම වර්ග සෑදීම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | සරුවත් හෝ පැණි බීම වෙළඳාමක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | පොහොර හෝ රසායනික ද්‍රව්‍ය ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | වෑල්ඩින් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | කලුගල් මෝලක් හෝ කලු ගල් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | සිල්ලර වෙළඳ සැලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | රෙදිපිළි විකිණීමේ ස්ථානයක් පත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | ප්ලාස්ටික් බඩු විකිණීමේ හෝ ප්ලාස්ටික් නාම පුවරු සැකසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 700 0 |
| 32. | ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | මල් වෙළඳසලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | පැළ තවානක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | සුරතල් මසුන් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | සිමෙන්ති භාණ්ඩ හා කොන්ක්‍රීට් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | සෙල්ලම් බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

| | *ව්‍යාපාරයේ නම* | *වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන* | *වාර්ෂික වටිනාකම රු. 750 ඉක්මවන රු.1,500 නොඉක්මවන* | *වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන අවස්ථාව* |
|---|---|---|---|---|
| | | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| 38. | ස්වර්ණාභරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 39. | පිත්තල උපකරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | වීඩියෝ කැසට් කුලියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 41. | මෝටර් සයිකල් අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 42. | කුළු බඩු පැකට් කර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 43. | විසිතුරු භාණ්ඩ හෝ අත්කම් භාණ්ඩ හෝ සුවඳ විලවුන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 44. | බෑග් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 45. | සම්භාණ්ඩ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 600 0 | 750 0 | 1,000 0 |
| 46. | වීදුරු කැපීමේ හා අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 47. | ෆාමසියක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 700 0 |
| 48. | සිංහල බෙහෙත් බඩු කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 49. | ග්‍රොසරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 50. | පරිගණක අලුත්වැඩියා කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 51. | යකඩ බඩු අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 52. | දැව ගබඩාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 53. | විද්‍යුත් ලෝහාලේපනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 54. | බැටරි චාර්ජ් කිරීම හා අළුත් වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 55. | මෝටර් වාහන අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 56. | ලියවන පට්ටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 57. | හඳුන්කූරු නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 58. | විදුලි උපකරණ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 59. | මෝටර් වාහන සේවා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 60. | ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිණීම හා ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 61. | වායුසමන හෝ ශීතකරණ හෝ අධි ශීතකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 62. | විදුලි කාර්මික වැඩපළක් පවත්වාගෙන යාම | 800 0 | 900 0 | 1,000 0 |
| 63. | පෙට්‍රල්, ඩීසල් හෝ ඛණිජ තෙල් ගබඩා කිරීම හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 64. | පින්තාරු තීන්ත, වාර්නිස් තීන්ත, ඩිස්ටෙම්පර් හෝ සායම් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 65. | ත්‍රී රෝද රථ අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

**උපලේඛනය 02**

| | | | | |
|---|---|---|---|---|
| 01. | පිඟන්, වීදුරු බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | පාවහන් වෙළඳාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | පොත්පත්, ලිපිද්‍රව්‍ය ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 04. | ඉංග්‍රීසි බෙහෙත් ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | පුද්ගලික ඩිස්පෙන්සරියක් පවත්වාගෙන යාම (බටහිර) | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | පුද්ගලික ඩිස්පෙන්සරියක් පවත්වාගෙන යාම (ආයුර්වේද) | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | දත් බඳින ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | ගුවන් විදුලි යන්ත්‍ර, මහන මැෂින්, රූපවාහිනී යන්ත්‍ර, විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 600 0 | 800 0 | 1,000 0 |
| 10. | දුරකථන, ටෙලෙක්ස්, ෆැක්ස් සේවා සපයන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | තානායමක් හෝ ලැගුම්හලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | සිනමා ශාලාවක් පවත්වාගෙන යාම | 800 0 | 900 0 | 1,000 0 |
| 13. | මිනී පෙට්ටි නිපදවීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | ඩ්‍රයික්ලීන් කිරීමේ ස්ථානයක් හෝ ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | ඡායා පිටපත් ලබා ගැනීම සහ දුරකථන සේවා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | වීඩියෝ චිත්‍රපට පෙන්වීම ආසන 25ට වැඩි (එක් දර්ශනයක් සඳහා) | 500 0 | 750 0 | 1,000 0 |

| | ව්‍යාපාරයේ නම | වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක රු. ශ. | වාර්ෂික වටිනාකම රු. 750 ඉක්මවන නමුත් 1,500 නොඉක්මවන අවස්ථාවක රු. ශ. | වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන අවස්ථාවක රු. ශ. |
|---|---|---|---|---|
| 17. | මල් වෙළඳසලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | ඇඳුම් මැසීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | ඔරලෝසු අළුත්වැඩියා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | ලොතරැයි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | සෙල්ලම් බඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | ගෑස් බෙදා හැරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | අළුත් වාහන විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | උත්සව ශාලා කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | පා පැදි හෝ යතුරු පැදි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | හිස් බෝතල්, ගෝනි හෝ පරණ කඩදාසි ගබඩාකර තබාගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | දැන්වීම් පුවරු සකස් කිරීමේ හා ඇඳීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | සිංහල බෙහෙත් බඩු කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | මනාලියන් හැඩ ගැන්වීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | ග්‍රොසරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | බිම් මල් නිෂ්පාදනය කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | පරිගණක අළුත්වැඩියා කිරීමේ හා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | ගීත කැසට්පට වීඩියෝ චිත්‍රපට අලෙවිය හෝ කුළියට දීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | ටයර් ටියුබ් වෙළෙඳසලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | පුවත්පත් බෙදා හැරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | දැව ගබඩාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 38. | තොග වශයෙන් විකිණීම සඳහා පිටි, සීනි හොණ්ඩර 15ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 39. | පුවත්පත් වෙළඳ සැලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | ගඩොල් හා උළු ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 41. | එළවළු, පළතුරු වෙළෙඳසලක් පවත්වාගෙන යාම | 600 0 | 800 0 | 1,000 0 |
| 42. | රස කැවිලි හා බයිට් වර්ග නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 43. | ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 44. | හකුරු නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 45. | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 46. | බුලත්, පුවක් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 700 0 |

03-843/11

---

**වලපනේ ප්‍රාදේශීය සභාව**

2015 වර්ෂය සඳහා බදු හා බලපත්‍ර ගාස්තු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149,150,151 හා 152(1) වගන්ති යටතේ 2015 වර්ෂය සඳහා වලපනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත සඳහන් උපලේඛනවල දක්වා ඇති පරිදි ඇතැම් ව්‍යාපාර සම්බන්ධයෙන් වාර්ෂික වටිනාකම මත පදනම් වූ වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් ද ඇතැම් ව්‍යාපාර සම්බන්ධයෙන් පසුගිය වර්ෂයේ වෙළඳ ව්‍යාපාරයේ ආදායම් මත පදනම් වූ වාර්ෂික බද්දක් ද 2015 වර්ෂය සඳහා පනවා අය කිරීමට 2014.12.15 දින මහ සභාවෙන් තීරණ අංක 2.2.8 යටතේ තීරණය කළ බවත් එකී බලපත්‍ර ගාස්තුව හා බදු 2015.03.31 දිනට පෙර මෙම සභාවෙන් බලපත්‍රය ලබාගත යුතු බවත් අලුතින් ආරම්භ කරන ව්‍යාපාර සඳහා නියමිත බදු හා බලපත්‍ර ගාස්තු එම ව්‍යාපාර ආරම්භ කිරීමට පෙර ගෙවා මෙම සභාවෙන් බලපත්‍රය ලබා ගත යුතු බවත් මෙයින් දැනුම් දෙමි.

ප්‍රාදේශීය සභාව වෙනුවෙන්,

සභාපති,
වලපනේ ප්‍රාදේශීය සභාව.

2014 ක් වූ දෙසැම්බර් මස 15 වැනි දින,
වලපනේ ප්‍රාදේශීය සභාව,
වලපනේ.

**උපලේඛන අංක 01**

*1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය යටතේ පැනවෙන බලපත්‍ර ගාස්තු*

| | | වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාව | වාර්ෂික වටිනාකම රු. 750 ඉක්මවන නමුත් රු.1,500 නොඉක්මවන අවස්ථාව | වාර්ෂික වටිනාකම රු. 1,500 ඉක්මවන අවස්ථාවක |
|---|---|---|---|---|
| | | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 01. | හෝටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 02. | බත් කඩයක් පවත්වාගෙන යාම | 600 0 | 750 0 | 1,000 0 |
| 03. | තේ කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 04. | කෝපි කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 700 0 |
| 05. | ආපන ශාලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | බේකරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 07. | කිරි පට්ටියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 08. | කිරි වෙළෙඳාම පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 09. | මාළු විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | මස් වෙළෙඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 11. | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 12. | ශබ්ද වාහිනී යන්ත්‍ර පවත්වාගෙන යාම | | | |
| 13. | ලැගුම් නිවාසයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | කොණ්ඩා සැකසීමේ සැලුන්හල් හා බාබර් සාප්පු පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | ආහාර විකිණීම පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |

03-843/10

---

**වලපනේ ප්‍රාදේශීය සභාව**

2015 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් ගාස්තු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 221 (අ) හා 122-126 යන වගන්ති යටතේ 1988.08.23 වැනි දින අංක 520/07 දරන IV (අ) වැනි කොටසේ පළාත් පාලන අති විශෙෂ ගැසට් පත්‍රයේ ගරු ඇමතිතුමා විසින් ප්‍රකාශයට පත් කර ඇති අතුරු ව්‍යවස්ථාවේ 29 වැනි ඡේදය යටතේ වලපනේ ප්‍රාදේශීය සභා බල සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් (බැනර් ඇතුළුව) ඉදිකිරීම සහ ප්‍රදර්ශනය කිරීම වෙනුවෙන් එක් දැන්වීමකට වර්ග අඩියකට රු. 40ක මුදලක් හා ස්ථිර දැන්වීම් පුවරුවක් සඳහා වර්ග අඩියකට රු. 60 ක මුදලක් හා ඩිජිටල් දැන්වීම් පුවරුවක් සඳහා වර්ග අඩියකට රු. 60 බැගින් 2015.01.01 දින සිට අය කර ගැනීමට 2014.12.15 වැනි දින මහ සභාවේ තීරණ අංක 2.2.5 සභා සම්මුතිය යටතේ තීරණය කළ බව මෙයින් දැනුම් දෙමි.

ප්‍රාදේශීය සභාව වෙනුවෙන්,

සභාපති,
වලපනේ ප්‍රාදේශීය සභාව.

2014 ක් වූ දෙසැම්බර් මස 15 වැනි දින,
වලපනේ ප්‍රාදේශීය සභාව,
වලපනේ.

03-843/5

---

**වලපනේ ප්‍රාදේශීය සභාව**

2015 වර්ෂය සඳහා ගාස්තු පැනවීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතින් පැවරී ඇති බලතල ප්‍රකාරව නිකුත් කරනු ලබන සහතික කිරීම්වලින් හා අවසර දීම් සඳහා මෙහි පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2015.01.01 වැනි දින සිට අය කළ යුතු බවට 2014.12.15 වැනි දින මහ සභාවෙන් තීරණ අංක 2.2.9 සභා සම්මුතිය යටතේ තීරණය කළ බව මෙයින් දැනුම් දෙමි.

ප්‍රාදේශීය සභාව වෙනුවෙන්,

සභාපති,
වලපනේ ප්‍රාදේශීය සභාව.

2014ක් වූ දෙසැම්බර් මස 15 වැනි දින,
වලපනේ,
වලපනේ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

| | | රු. ශත |
|---|---|---|
| 01. | පුස්තකාල ඉල්ලුම්පත්‍ර ගාස්තු | 25 0 |
| 02. | පුස්තකාල සාමාජික ගාස්තු | 10 0 |
| 03. | පුස්තකාල ප්‍රමාද ගාස්තු (එක් දිනකට) | 0 50 |
| 04. | වීථි රේඛා සහතික ගාස්තු | 1,000 0 |
| 05. | ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තු | 1,000 0 |
| 06. | සභාව සතු ඉඩම් උත්සව/වෙනත් කටයුතු සඳහා බදු දීම (වර්ග අඩි 01ට) | 100 0 |
| 07. | නව ජල සැපයුමක් ලබා ගැනීම සඳහා ඉල්ලුම්පත්‍ර ගාස්තු | 100 0 |
| 08. | වරිපනම් බදු, අක්කර බදු උධෘත සහතික සඳහා ගාස්තු | 500 0 |
| 09. | ප්‍රජා ශාලාව කුලියට දීම (එක් දිනකට) | 500 0 |
| 10. | නොපවරා ගැනීමේ සහතිකයක් සඳහා ගාස්තු | 250 0 |
| 11. | පරිසර ආරක්ෂණ බලපත්‍ර අයදුම්පත්‍රයක් සඳහා ගාස්තු | 100 0 |
| 12. | පෙර පාසල් ලියාපදිංචි ගාස්තු | 500 0 |

03-843/4

---

## වලපනේ ප්‍රාදේශීය සභාව

### 2015 වර්ෂය සඳහා ඉඩම් විකිණීම මත බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) වැනි වගන්තිය ප්‍රකාරව වලපනේ ප්‍රාදේශීය සභා බල සීමාව තුළ පිහිටි ඉඩමක්/අනු බෙදුමක් වෙන්දේසිකරුවෙකු, තැරැව්කරුවෙකු හෝ ඔහුගේ සේවකයා හෝ අනු ප්‍රාප්තිකයෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ අන්‍යාකාරයකින් විකුණනු ලබන අවස්ථාවක දී එම ඉඩම විකිණීමෙන් ලත් මුදලින් 01%කට සමාන බද්දක් විකුණුම් කරු, වෙන්දේසිකරු, තැරැව්කරු හෝ ඔහුගේ ආයෝජකයා විසින් 2015 වර්ෂය සඳහා වලපනේ ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු බව 2014.12.15 වැනි දින මහ සභාවෙන් තීරණ අංක 2.2.3 සහා සම්මුතිය යටතේ තීරණය කළ බව මෙයින් දැනුම් දෙමි.

ප්‍රාදේශීය සභාව වෙනුවෙන්,

සභාපති,
වලපනේ ප්‍රාදේශීය සභාව.

2014 ක් වූ දෙසැම්බර් මස 15 වැනි දින,
වලපනේ ප්‍රාදේශීය සභාව,
වලපනේ.

03-843/9

---

## වලපනේ ප්‍රාදේශීය සභාව

### 2015 වර්ෂය සඳහා අක්කර බදු අය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(3) වැනි වගන්තිය ප්‍රකාර වලපනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් බදු අය නොකරන ප්‍රදේශවල පිහිටියා වූ ද, ස්ථිර හෝ නිතිපතා ගොවිතැන් යටතේ වූ ද, හෙක්ටයාර් 05ට අඩු නමුත් හෙක්ටයාර් 01ට නොඅඩුවන අවස්ථාවක හා ඊට වැඩි වන අවස්ථාවක ඉඩම්වලින් පහත දැක්වෙන උපලේඛනයේ දැක්වෙන ප්‍රමාණයන්ගෙන් යුතු අක්කර බද්දක් 2015 වර්ෂයට පනවා, 2015 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 වැනි දායින් අවසන් වන පරිදි කාර්තු 04 කින් අය කර ගැනීමට 2014.12.15 වැනි දින මහ සභාවේ තීරණ අංක2.2.2 සභා සම්මුතිය යටතේ තීරණය කර ඇති බවත්, එම බදු මුදල් එකී කාර්තුව අවසන් වීමට පෙර ගෙවිය යුතු බවත්, දැනුම් දෙමි.

ප්‍රාදේශීය සභාව වෙනුවෙන්,

සභාපති,
වලපනේ ප්‍රාදේශීය සභාව.

2014 ක් වූ දෙසැම්බර් මස 15 වැනි දින,
වලපනේ ප්‍රාදේශීය සභාව,
වලපනේ.

උපලේඛනය

| ඉඩම් ප්‍රමාණය | බදු අනු ප්‍රමාණය රු. ශත |
|---|---|
| 01. හෙක්ටයාර 05 හෝ ඊට වැඩිවන අවස්ථාවක | 10 0 |

03-843/1

---

## වලපනේ ප්‍රාදේශීය සභාව

### 2015 වර්ෂය සඳහා රථ වාහන හා සතුන් පිළිබඳ බද්ද

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වැනි වගන්තිය යටතේ පහත උපලේඛනයේ සඳහන් අනුප්‍රමාණ අනුව වාහන හා සතුන් පිළිබඳ බද්දක් වලපනේ ප්‍රාදේශීය සභා සීමාව තුළ 2015 වර්ෂය සඳහා අය කිරීමට තීරණය කළ බව, එකී පනතේ 147 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම් දෙන අතර, 148 (3) වැනි වගන්තිය යටතේ මෙම බදු මුදල අයකර ගැනීමට 2014.12.15 වැනි දින මහ සභාවෙන් තීරණ අංක 2.2.1 යටතේ සභා සම්මුතියෙන් තීරණය කළ බවත්, 2015.03.31 වැනි දිනට පෙර ගෙවිය යුතු බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ප්‍රාදේශීය සභාව වෙනුවෙන්,

සභාපති,
වලපනේ ප්‍රාදේශීය සභාව.

2014 ක් වූ දෙසැම්බර් මස 15 වැනි දින,
වලපනේ ප්‍රාදේශීය සභාව,
වලපනේ.

උපලේඛනය

| | | රු. ශත |
|---|---|---|
| | මෝටර් රථයක්, මෝටර් ට්‍රයි කාරයක්, මෝටර් ලොරියක්, බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක්, ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහාම – | 30 0 |
| | සෑම ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා - | |
| (අ) | වෙළෙඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 18 0 |
| (ආ) | වෙළෙඳ නොවන කාර්යයන් සඳහා යොදවන්නේ නම් | 4 0 |
| (ඇ) | සෑම කරත්තයක් සඳහාම | 20 0 |
| | සෑම අත් කරත්තයක් සඳහාම | 7 0 |
| | සෑම රික්ෂෝවක් සඳහාම | 10 0 |
| | සෑම අශ්වයකු, පෝනියකු, කොටළුවකු සඳහාම | 15 0 |
| | සෑම ඇතකු සඳහාම | 50 0 |

03-843/2

## පූජාපිටිය ප්‍රාදේශීය සභාව

### වෙනත් අයකිරීම්

පූජාපිටිය ප්‍රාදේශීය සභාව මගින් 2015 පෙබරවාරි මස 12 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කර ගන්නා ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

අනුර කුමාර මඩලුස්ස,
සභාපති,
පූජාපිටිය ප්‍රාදේශීය සභාව.

2015 පෙබරවාරි මස 12 වැනි දින,
පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ දී ය.

### උපලේඛනය

| | | |
|---|---|---|
| 1. බැකෝ යන්ත්‍රය කුලියට දීම | පැය 01ක් සඳහා රු. 2,300 | |
| 2. ටිපර් රථය කුලියට දීම | පළමු කි. මී. 1 සඳහා රු. 891<br>වැඩිවන කි. මී. 10 සඳහා රු. 311 බැගින් | |
| 3. ගල් රෝල කුලියට දීම | පැය 8 කට රු. 8,500 | ප්‍රවාහනය සඳහා ට්‍රැක්ටර් කුලිය කි . මී. 1 ක් සඳහා රු. 102 බැගින් |
| 4. කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය | පැය 8 කට රු. 3,000 | |
| 5. වතුර බවුසරය කුලියට දීම<br>ට්‍රැක්ටර් කුලිය කි. මී. 1 සඳහා | හිස් බවුසරයකට දිනකට රු. 500<br>රු. 102 බැගින් | |
| 6. ශරීර සුවතා මධ්‍යස්ථානය සඳහා ගාස්තු අය කිරීම් | ඇතුළත් වීමේ ගාස්තුව රු. 1,000<br>මාසික ගාස්තුව සාමාජිකයකු සඳහා රු. 600 | |
| 7. ගලි යන්ත්‍රයේ සේවය ලබා ගැනීමට ලිපියක් නිකුත් කිරීමේ ගාස්තු රු. 500 | | |

- පාසල් ළමුන් හා අඩු ආදායම් ලාභී දිළිඳු පවුල්වල සාමාජිකයන් සඳහා ගාස්තුවෙන් 15%හා රජයේ නිලධාරින් සඳහා ගාස්තුවෙන් 10%ක මුදලක් අඩු කිරීමක් කරනු ලැබේ.
- සභාව සතු පෙර පාසල් සඳහා අයකිරීම් - එක් දරුවකු සඳහා මාසික ගාස්තුව රු. 300 0
- වැසි ආවරණ කුටි සඳහා අය කිරීම්
  20' x 15' ප්‍රමාණයේ කුටිය - එක් දිනක් සඳහා — රු. 3,000
  වැඩිවන සෑම දිනකටම — රු. 750 බැගින්
- 15' x 10' ප්‍රමාණයේ කුටිය - එක් දිනක් සඳහා — රු. 2,500 වැඩිවන සෑම දිනකටම රු. 500 බැගින්
- 10' x 10' ප්‍රමාණයේ කුටිය එක් දිනක් සඳහා — රු. 2,000
  වැඩිවන සෑම දිනකටම — රු. 250 බැගින්

03-815/2

---

## පූජාපිටිය ප්‍රාදේශීය සභාව

### ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථානුකූල ගාස්තු අය කිරීම - 2015 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 126(VII)ඊ සහ 126(XXX) වැනි වගන්ති ප්‍රකාරව, ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව, 2015 වර්ෂයේ පෙබරවාරි මස 12 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේදී තීරණ අංක 07.01.02 අනුව, පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

අනුර කුමාර මඩලුස්ස,
සභාපති,
පූජාපිටිය ප්‍රාදේශීය සභාව.

2015 පෙබරවාරි මස 12 වැනි දින,
පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ දී ය.

### යෝජනාව

"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 126(VII)ඊ සහ 126(XXX) වැනි වගන්ති ප්‍රකාර ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල අනුව, 1988.08.23 වැනි දින අංක 520/7 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ පළාත් පාලන, නිවාස හා ඉදිකිරීම් ගරු අමාත්‍යතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාව, පූජාපිටිය ප්‍රාදේශීය සභාව මගින් වැළඳගෙන 2004.11.12 වැනි දින අංක 1345 දරන ගැසට් පත්‍රයේ IV(ආ) කොටසේ පළකරනු ලැබූ එම අතුරු ව්‍යවස්ථාවේ 39 වැනි අතුරු ව්‍යවස්ථාව වන ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථා විධිවිධාන අනුව, පූජාපිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇලකට, වැවකට, මුහුදට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ සඳහන් පරිදි ගාස්තුවක් 2015 වර්ෂය සඳහා පනවා අය කිරීමට පූජාපිටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

*උපලේඛනය*

| | | *රු. ශත* |
|---|---|---|
| 01 | ප්‍රචාරක දැන්වීම් ඉටි රෙදි හෝ රෙදි (බැනර්) වර්ග අඩියකට (මාසයකට) අඩු කාලයක් සඳහා | 25 0 |
| | වර්ග අඩියකට(මාසයකට) වැඩි කාලයක් සඳහා | 30 0 |
| | ස්ථිර දැන්වීම් ලිත් වර්ෂයකට වර්ග අඩියකට තහඩු වලින් | 100 0 |
| | | *රු. ශත* |
| 02 | බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරන අවස්ථාවක, ඉටි රෙදි හෝ රෙදි වලින් | 75 0 |
| 03. | ස්ථිර ප්‍රතිදීප්ත විදුලි ආලෝක කරන දැන්වීම් පුවරුව සඳහා | 100 0 |

03-815/1

---

**වලපනේ ප්‍රාදේශීය සභාව**

2015 වර්ෂය සඳහා වරිපනම් බදු අයකිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) සහ 134(2) වැනි වගන්තිය ප්‍රකාරව වලපනේ ප්‍රාදේශීය සභා බල සීමාව තුළ පිහිටි පහත උපලේඛනයේ සඳහන් ප්‍රදේශවල පිහිටි නිශ්චල දේපළවල වාර්ෂික වටිනාකමකින්, එම දේපළ වලට අනුරූපීව දක්වා ඇති සියයට ප්‍රමාණය අනුව දේපළ බද්දක් 2015 වර්ෂයට පනවා, 2015 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 වැනි දායින් අවසන්වන කාර්තු 04 කින් අයකර ගැනීමට 2014.12.15 දින මහ සභාවෙන් තීරණ අංක 2.2.4 යටතේ තීරණය කළ බවත් එම බදු මුදල් එකී කාර්තුව අවසන් වීමට පෙර ගෙවිය යුතු බවත් දැනුම් දෙමි.

තවද, මෙම පනතේ 134(7) වගන්තිය ප්‍රකාර එකී වාර්ෂික බදු මුදල් පහත සඳහන් පරිදි සම්පූර්ණයෙන් ගෙවූ විට, එහි දැක්වෙන වට්ටම් මුදල් ප්‍රදානය කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*(අ)* 2015.01.31 දින හෝ ඊට පෙර මුලු වර්ෂයටම ගෙවිය යුතු බද්ද ගෙවනු ලැබුවහොත් එම මුදලින් 10%ක් ;

*(ආ)* බදු මුදල කොටස් වශයෙන් ගෙවන විට වරිපනම් බද්ද ගෙවිය යුතු කාර්තුවේ පළමු මාසය තුළ ගෙවනු ලැබුවහොත්, එසේ ගෙවන මුදලින් 05% ක් වේ.

ප්‍රාදේශීය සභාව වෙනුවෙන්,

සභාපති,
වලපනේ ප්‍රාදේශීය සභාව.

2014 ක් වූ දෙසැම්බර් මස 15 වැනි දින,
වලපනේ ප්‍රාදේශීය සභාව,
වලපනේ.

**උපලේඛනය**

| | | |
|---|---|---|
| 1. | වලපනේ නගර ප්‍රදේශය | 06% |
| 2. | රාගල නගරය, හා උඩපුස්සැල්ලාව නගර ප්‍රදේශය | 12% |
| 3. | නිල්දණ්ඩාහින්න නගර ප්‍රදේශය | 06% |
| 4. | පදියපැලැල්ල නගර ප්‍රදේශය | 06% |

03-843/7

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.